දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය - 2019

12 ශ්‍රේණිය | බෞද්ධ ශිෂ්ටාචාරය | විසඳුම් පත්‍රය

## I - පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. 2 | 02. 1 | 03. 5 | 04. 1 | 05. 2 | 06. 3 | 07. 5 | 08. 2 | 09. 3 | 10. 4 |
| 11. 2 | 12. 4 | 13. 3 | 14. 1 | 15. 2 | 16. 3 | 17. 4 | 18. 5 | 19. 5 | 20. 4 |
| 21. 5 | 22. 3 | 23. 5 | 24. 1 | 25. 4 | 26. 2 | 27. 3 | 28. 1 | 29. 2 | 30. 4 |
| 31. 3 | 32. 4 | 33. 5 | 34. 2 | 35. 1 | 36. 3 | 37. 5 | 38. 4 | 39. 2 | 40. 1 |
| 41. 2 | 42. 3 | 43. 5 | 44. 2 | 45. 4 | 46. 5 | 47. 1 | 48. 1 | 49. 3 | 50. 4 |

(2 × 50 = 100)

## II කොටස

01. i. පශුපාලනය, දන්දීම, යාග කිරීම, ඉගෙනීම, වෙළඳාම මුදල් පොලියට දීම. කෘෂිකර්මාන්තය

ii. * බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව පුද්ගල ජීවිතය අවධි හතරකට බෙදා තිබුණි.
* බ්‍රාහ්මචාරී, ගෘහස්ථ වානප්‍රස්ත සන්‍යාසි වශයෙනි.
* බ්‍රාහ්මචාරී: ශිර්ෂ්‍යයෙකු ලෙස වේදය හා ශිල්ප ශාස්ත්‍රය හැදෑරීමේ කාලයයි.
* ගෘහස්ථ : විවාහ වී අඹුදරුවන් පෝෂණය කිරීම, පස්කම් සුව විඳිමින් සාර්ථක ගෘහජීවිතයක් ගත කිරීම පිරිමි පුතකු බිහි කිරීම අනිවාර්ය විය.
* වානප්‍රස්ත : වනගත වී තවුස්දම් රැකීම.
* සන්‍යාසි : බ්‍රහ්මසහව්‍යතාවය පතමින් අනගාරික යෝගී ජීවිතයක් ගත කිරීම.

iii. * අගනුවර රජගහනුවරයි. බිම්බිසාර, අජාසත්ත රජවරු බුද්ධකාලීන පාලකයන් විය.
* වේභාර වේපුල්ල, ගිජ්ඣකූට, ඉසිගිලි, පාණ්ඩව යන පර්වත පහකින් යුක්ත වූ නිසා ''ගිරිබ්බජ'' නමින් ද ප්‍රදේශය හැඳින්විය.
* බුදුරදුන් හා බිම්බිසාර රජු අතර සබඳතා පැවතියේ ය.
* පළමු ආරාමය වූ වේළුවනාරාමය බිම්බිසාර රජු විසින් පූජා කළේ ය.
* රාජාණ්ඩු පාලන ක්‍රමයක් පැවතියේ ය.
* බලය පුළුල් කර ගැනීමට මත්ස්‍ය න්‍යාය භාවිතා කළේ ය ආදී කරුණු පිළිතුරෙහි අඩංගු විය යුතුය.

iv. * මහාචාර්ය මැක්ස්මුලර්, මහාචාර්ය ලක්ෂ්මීනරසු, ඇල්බට් අයින්ස්ටයින්, බර්ට්‍රන්ඩ් රසල්, එඩ්වින් අර්නෝල්ඩ්, මහාචාර්ය සොණ්ඩර්ස් යනාදීන් විසින් කරන ලද ඇගයීම් දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.

v. * විපස්සනා ඥාණය
* මනෝමය ඍද්ධි ඥාණය
* ඉද්ධි විධ ඥාණය
* දිබ්බ සෝත ඥාණය
* පරචිත්ත විජානන ඥාණය
* පුබ්බේ නිවාසානුස්සති ඥාණය
* දිබ්බ චක්ඛු ඥාණය
* ආසවක්ඛය ඥාණය

02. i. * සත්ත්වයා හා ලෝකය ඊශ්වර නිර්මාණවාදී ලෙස පිළිගැනීම
* වර්ණාශ්‍රම ධර්ම ආදිය දිව්‍යමය ප්‍රභවයක් ලෙස දැක්වීම
* වේදග්‍රන්ථ පරම සත්‍යය ලෙස පිළිගැනීම
* යාගය, පුදසත්කාර, ගීතිකා ගායනය ආදිය මුල්කරගත් කර්ම මාර්ගය ලෞකික, ලෝකෝත්තර සැප පිණිස ඒකායන මාර්ගය ලෙස පිළිගැනීම.
* අගාරික ප්‍රතිපදාව පිළිගැනීම
* පුද්ගල ස්වච්ඡන්දතාවය, ස්වාධීනත්වය, දේව නිර්මාණ වාදයට යටපත් කළ බව.
* පුද්ගලයාගේ උසස් පහත් බව ජන්මීය සාධක මත තීරණය කිරීම
* කාන්තා නිදහස අහුරා තැබීම

ii. * සත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හෝ හේතු ප්‍රත්‍යයක් නැතැයි ඉගැන්වූ මොහු අහේතු අප්‍රත්‍ය වාදියෙකි.

* නියත වාදියෙකු පටිච්ච සමුප්පන්නවාදියෙකු ලෙස ද හැඳින්වේ.
* උත්සාහය වීර්යය අධිෂ්ඨානය, පුරුෂ බලය, පුරුෂ පරාක්‍රමය, ප්‍රතික්ෂේප කරයි. සියලු ප්‍රාණීන් වීර්යය රහිත, බල රහිත, ස්ව කැමැත්තට අනුව කටයුතු කළ නොහැකි පිරිසක් ලෙස දක්වයි. ඒ නිසා අහේතු අප්‍රත්‍ය වාදයක් උගන්වයි.
* නත්ථි මහාරාජ හේතු, නත්ථි පච්ච යෝ සත්තානං සංකිලේසාය.
* කර්ම විපාක බැහැර කරන නිසා අකිරියවාදියෙකි.

iii. සියලු කෙලෙස්වලින් දුරු වූ බැවින් ද, සංසාර චක්‍රයේ අර සියලු බැවින් ද කෙලෙස් සතුරන් නැසූ බැවින් ද රහස් නොමැති බැවින් ද (රහසින් හෝ පව් නොකළ බැවින් ද) සියලු පූජාවන්ට සුදුසු බැවින් ද ''අරහං'' නමින් හඳුන්වයි.

iv.
* නකුල පිතා නම් ගුණවත් උපාසක තුමාගේ බිරිඳයි.
* යොවුන් වියේ සිටම ආදර්ශ සමාපන්න විවාහ ජීවිතයක් ගත කිරීම නිසා බුදුරදුන්ගේ ඇගයීමට ලක් විය.
* සිතිනුත් කයිනුත් පතිවත රැකි කාන්තාවකි.
* ශ්‍රද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණ ධර්ම ආරක්ෂා කළේය.
* නකුල මාතාවගේ සත්‍ය ක්‍රියා මත නකුල පිතාගේ රෝග සුව විය.
* නකුල පිතා සමඟ සමගියෙන් ආදර්ශ සමාපන්නව ඔහුට අවවාද දෙමින් යහපත් ජීවිතයක් ගත කළේය.
* විශ්වාසවන්ත උපාසිකාවන් අතර අග්‍ර විය.
* තෙරුවන් කෙරෙහි අප්‍රමාණ ගෞරවනියකින් යුක්ත විය.

v. දානය, සීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, ක්‍රෝධ නොකිරීම, අවිහිංසාව, ඉවසීම, විරුද්ධ නොවීම.

03. i.
* ආකාරවති ශ්‍රද්ධාව හා අමූලිකා ශ්‍රද්ධාව ලෙස ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද දෙකකි. ආකාරවති ශ්‍රද්ධාව යනු ප්‍රඥාවෙන් යුක්තව, වීමංසාවෙන් ඇති කරගන්නා අවබෝධයයි. ආකාරවති ශ්‍රද්ධාව දර්ශනය මූලික කර ගත්තකි. බුදු සමය පිළිගනු ලබන්නේ ආකාරවතී ශ්‍රද්ධාවයි. නිර්වාණගාමී ප්‍රතිපදාවේ ආරම්භක පදනම වනුයේ තෙරුවන් කෙරෙහි අවබෝධයෙන් ඇතිවන්නා වූ පැහැදීමයි.

ii.
* මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණවල තෙවැන්න මුදිතාවයි.
* අන්‍යයන්ගේ දියුණුව දැක සතුටු වීමේ හැකියාවයි.
* දෙමාපියන් තුළ පිහිටි ගුණ ධර්මයකි.
* ඊර්ෂ්‍යාව ක්‍රෝධය යටපත් කිරීමට හේතු වෙයි.
* වර්තමාන සමාජයට ද ප්‍රයෝජනවත්ය.
* සාමය, සමගිය, සහජීවනය සඳහා හේතුවන්නකි.
* සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීමට හේතුවන්නකි.

iii.
1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාලභෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්චගීත වාදිත, විසූක දස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
8. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි

iv.
* කෝලිත පිරිවැජියා සමඟ වේළුවනාරාමයේ දී පැවිදි වූ උපතිස්ස පිරිවැජියා සැරියුත් හිමි නමින් ප්‍රකට විය.
* සූකරඛත ලෙනේදී වේදනා පරිග්ගහ සූත්‍රය අසා රහත්ඵලය ලැබීය.
* ශ්‍රී සද්ධර්මය මැනවින් මතක තබා ගැනීම නිසා ධර්ම සේනාධිපති තනතුරු ද හිමි විය.
* මහා ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අගතනතුරු හිමිවිය.
* පිරිනිවන් පෑමට පෙර මෑණියන් සෝවාවන් ඵලයෙහි පිහිටු වීමට හැකි විය.
* චාලා උපචාලා, සිසූපචාලා යන තම සහෝදරියන් සසුන් ගත කරවා රහත් තෙරණිවරු බවට පත් කිරීමට සමත් විය.
* ගැඹුරු දහම් කරුණු සරල ලෙස විස්තර කිරීමේ හැකියාව තිබූ බව.
* ඉවසීමත්, නිහතමානී බවත් තුළින් සසුන්කෙත බැබලවීමට සමත් විය.

v. ඉගැන්වීම, ඉගෙනීම, යාග කිරීම, යාග කරවීම, දන්දීම, දන් පිළිගැනීම, ප්‍රජා පාලනය, පශු පාලනය, වෙළඳාම, මුදල් පොලියට දීම, කෘෂිකර්මාන්තය යනාදියයි.

## II කොටස

04. i. * ස්වධර්ම සංකල්පය යනු බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව ඒ ඒ වර්ණයන්ට හිමි වූ කාර්යයන්ය.
* මනුස්මෘතියේ සඳහන් පරිදි බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය වෛශ්‍ය ශුද්‍ර යන සිවුකුලයේ සාමාජිකයන්ට පැවති තිබූ කටයුතු වෙන්වෙන්ව සඳහන් කළ යුතුය.
* ස්වකීය වර්ණයට අයත් ''ස්වධර්ම'' වැරදි ලෙස හෝ කිරීම අන්‍යවර්ණයක ධර්මයක් මනාව සම්පූර්ණ කිරීමට වඩා විශිෂ්ට බව මනුස්මෘතියේ අවධාරණය කර ඇත.

ii. * වර්ණ ධර්ම පිළිබඳ බ්‍රාහ්මණ මතය බුදු දහමේ විවිධ අයුරින් විචාරයට ලක් කර ඇත.
* ඓතිහාසික, ජීව විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක ආචාර විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක සාධක ඔස්සේ විචාරයට ලක් කළ ආකාරය දැක්විය යුතුය.
* බෞද්ධ මතය අනුව ඊශ්වර නිර්මාණවාදී මතය ප්‍රතික්ෂේප වන බව සඳහන් විය යුතුය.

05. i. * මගධ, කෝසල, වත්ස, අවන්ති ලෙස ප්‍රබල රාජාණ්ඩු හතරක් පැවති බව
* ඒවායේ පැවති හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ වනුයේ,
  - මහරජ කෙනකු විසින් පාලනය කිරීම
  - පියාගෙන් පුතාට රජකම උරුම වීම.
  - ව්‍යවස්ථාදායක විධායක, අධිකරණ යන ත්‍රිවිධ බලතල රජුට හිමි වීම.
  - නීති පැනවීම, නීති ක්‍රියාත්මක කිරීම හා දඬුවම් පැමිණ වීම ද රජු විසින් සිදු කිරීම
  - යුවරජ, පුරෝහිත, අධිකරණනායක, සේනාධිපති මඟින් බලය ක්‍රියාත්මක කිරීම
  - බලය පතුරුවා හැරීමට මත්ස්‍ය න්‍යාය භාවිතා කිරීම

ii. බිම්බිසාර රජු, කෙසොල් රජු යන රජවරු ප්‍රමුඛ රජවරු දෙදෙනෙක් බුදු සසුනේ දියුණුවට ක්‍රියා කළ ආකාරයත් බුදුරදුන් සමග පැවති සබඳතාත් පිළිතුරෙහි ඇතුළත් විය යුතුයි.

06. i. * ස්වධර්ම සංකල්පය තුළින් අධ්‍යාපනික ආගමික සාමාජික ආර්ථික අයිතීන් අහිමි වූ බව
* දාස මෙහෙවර පමණක් ශුද්‍රයාට හිමි වූ බව
* ආශ්‍රම ධර්ම සඳහා අවස්ථාව නොලැබුණු බව
* උපනයනය ඇතුළු කිසිම ආගමික කටයුත්තකට සම්බන්ධ විය නොහැකි වීම.
* වේදපාඨ ගායනය, සවන්දීම, තහනම් වූ අතර ආර්ථික අයිතීන් ද අහිමි විය.
* ශුද්‍රයන්ට ලබාදුන් විවිධ දඬුවම් පිළිබඳව ද මනුස්මෘතියේ සඳහන් වේ.

ii. බිරිඳක ලෙස :
* සිගාලෝවාද සූත්‍රයේ ස්වාමි භාර්ය, යුතුකම් තුළින් කාන්තාව බිරිඳක ලෙස ඇගයීමට ලක් කිරීම.
* විශාඛාවට තම පියාදුන් අවවාද බුදුරදුන් ද අගය කර ඇත.
* චතු සංවාස සූත්‍රයේ, යහපත් බිරිඳ අගය කිරීම
* සත්තභරියා සූත්‍රයේ බිරින්දෑවරු හත්දෙනෙකු අතරින් යහපත් භාර්යාවන් හතර දෙනකු අගය කිරීම.

මවක ලෙස :
* මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් යුක්ත බව
* බ්‍රහ්ම, පූර්වාචාර්ය, ආහුනෙය්‍ය වැනි ගුණාංගයන්ගෙන් යුක්ත බව
* මාතා පිතා දිසා පුබ්බා.... යනාදි ලෙස මවුපියන් පූර්ව දිසාවෙන් දක්වා ඇති බව - සිගාලෝවාද සූත්‍රය
* මාතා පිතු උපට්ඨානං.... යනාදි ලෙස මවුපියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් ලෙස මහාමංගල සූත්‍රයේ දක්වා තිබීම.
* වයස්ගත දෙමාපියන්ට නොසලකා හැරීම පරාභව හා වසල කරුණු වන බව (වසල, පරාභව සූත්‍ර)
* සිඟාලෝවාද සූත්‍රයේ දරුවන්ගේ යුතුකම් තුළින් දෙමාපියන් අගය කිරීම
* බුදුරදුන් මාතෘ දිව්‍ය රාජයාට දහම් දෙසීම.
* මව නිවසේ මිතුරිය ලෙස අගය කිරීම, මව ගෙදර බුදුන් ලෙස අගය කිරීම
* බුදුරජාණන් වහන්සේ ස්වකීය සුළු මව වූ ප්‍රජාපතී ගෝතමියට ගෞරව කිරීම.

07. i. * දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය යනු සතර සංග්‍රහවස්තු බව
* දානය ප්‍රජා සුභසාධනයයි. රටේ ආර්ථික සංවර්ධනය සඳහා පාලකයා ක්‍රියා කිරීම මින් බලාපොරොත්තු වන බව.
* සුහද හා ප්‍රියමනාප, සත්නිවේදනය, ප්‍රියවචනය නම් වන බව
* අනුන්ගේ දියුණුව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අර්ථචර්යාව බව

* ජාති, කුල, ගෝත්‍ර නොසලකා සැමට සමානව සැලකීම සමානාත්මතාවයයි.
* පාලකයා ද මෙම ගුණධර්ම ආරක්ෂාකරන විට යහපත් සමාජයක් බිහිවෙයි.

ii. * දානය : ප්‍රජා සුබසාධනයට රජු ක්‍රියාකළ යුතුය.
සීලය : ප්‍රතිපත්ති ගරුකව, සදාචාරාසම්පන්නව රජු ක්‍රියා කළ යුතුය.
* පරිත්‍යාගය : කාලය, ධනය, ශ්‍රමය, බුද්ධිය, මෙන්ම භෞතික සම්පත් ජනතාව වෙනුවෙන් යෙදවීම පාලකයාගේ යුතුකමකි.
* ඍජු බව : පාලකයා අගතිගාමී නොවී අවංකව ක්‍රියා කිරීම.
* මෘදු බව : ජනතාවගේ දුක් පීඩාවන් කෙරෙහි සංවේදීව ක්‍රියා කිරීමට පාලකයාට හැකි වීම.
* තපස : පවිටු සිතුවිලිවලට වහල් නොවී ඉන්ද්‍රිය දමනයෙන් යුතුව ක්‍රියා කිරීම
* ක්‍රෝධ නොකිරීම : ප්‍රජාව කෙරෙහි ක්‍රෝධයෙන් තොරව මෛත්‍රීයෙන් යුතුව කටයුතු කිරීම.
* අවිහිංසාව : මහජනයාට හිංසා පීඩා නොකිරීම.
* ඉවසීම : විරුද්ධ මතවාදයන් ද ක්‍රියා කාරකම් ද ඉදිරියේ ඉවසීමෙන් ක්‍රියා කිරීම.
විරුද්ධ නොවීම, මහජනයා සමඟත් වෙනත් පාලකයන් සමඟත් නොගැටී සහයෝගීව ක්‍රියා කිරීම.
මෙම කරුණු 10 තුළින් ජනහිතකාමී පාලනයක් සිදු කළ හැකි බව සඳහන් විය යුතුය.

08\. i. * ස්වාමීත්වය අනුව තමාට තමා හැර වෙනත් ස්වාමියෙකු හෝ තමා පාලනය කරන බලවේගයක් නොමැති බවයි.
* ස්වාධීනත්වය යනු : නිදහසේ තම කැමැත්ත පරිදි ක්‍රියා කිරීමේ හැකියාවයි.
* ස්වඡන්දතාවය : සිය කැමැත්ත පරිදි හොඳ නරක තමා විසින්ම තීරණය කිරීමයි.
* ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් අනුව සත්ත්වයා හා ලෝකය සර්වබලධාරී ඊශ්වරයෙකු විසින් පාලනය කරන බව දක්වයි. වර්ණ ධර්ම ස්වධර්ම, ආශ්‍රම ධර්ම තුළින් පුද්ගල ස්වාමීත්වයට ස්වාධීනත්වයට ස්වඡන්දතාවයට බාධා පැමිණ වීය.
* පුබ්බේකත හේතුවාදය, අහේතු, අප්පච්චයවාදය, නියතිවාදය වැනි ඉගැන්වීම් තුළින් මිනිසාගේ ස්වාධීනත්වයට බාධා පැමිණ වූ බව යනාදී කරුණු ඇතුළත් කරමින් පිළිතුර සකස් විය යුතුය.

ii. * පුද්ගලයාගේ ස්වාධීනත්වයට ස්වාමීත්වයට ස්වඡන්දතාවයට බාධා පමුණුවන ඉගැන්වීම් බුදුදහමින් ප්‍රතික්ෂේප විය.
* සිතා මතා ස්වාධීනව හොඳ නරක තේරුම් ගෙන තීරණ ගැනීමට නිදහස ඇති බව ද සචේතනික ක්‍රියා හා බැඳුණු වගකීම කර්තෘ වෙත පැවරෙන බව ද බෞද්ධ මතයයි.
* තමාගේ ජයග්‍රහණය මෙන්ම විමුක්තිද තමා විසින්ම සලසා ගත යුතුය.
* අත්තාහි අත්තනෝ නාථෝ කෝහිනාථෝ පරෝසියා
* අත්තදීපා විහරත - අත්තසරණා අනඤ්ඤසරණා...
* සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ.
* උට්ඨාන වීර්ය, අප්පමාද, පුරිසථාම, පුරිස බල, පුරිස වීරිය පුරිස පරක්කම, ආරම්භධාතු, නික්කමධාතු, පරක්කමධාතු, සම්මා වායාම වැනි ධනාත්මක ඉගැන්වීම් තුළින් පුද්ගල පෞරුෂය ගොඩ නැගීමට මග පෙන්වා ඇත.
* කාලාම සූත්‍රය හා වීමංසක සූත්‍රයේ කරුණු ද ඇතුළත් කළ හැකි ය.